# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.01.23 පැය 1015 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 125 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## ශ්‍රී විජේරාමය විහාරස්ථානය මඟින් වාෂර්ිකව පවත්වනු ලබන “දුරුතු නද” මහ පෙරහැර හේතුවෙන් මාගර් අවහිරතායක් සම්බන්ධව - නිට්ටඹුව පොලිස් වසම

නිට්ටඹුව පොලිස් වසමේ මල්වත්ත ශ්‍රී විජේරාමය විහාරස්ථානය මඟින් වාෂර්ිකව පවත්වනු ලබන “දුරුතු නද” මහා පෙරහැර 2025.01.24 වන දින රාත්‍රී 0830 සිට රාත්‍රී 1200 දක්වා විථි සංචාරය කිරීමට නියමිතය.

මෙම පෙරහර නිට්ටඹුව අත්තනගල්ල පාර කළුවාගස්විල ශ්‍රී විජයාරාම විහාරස්ථානයෙන් ආරම්භ වී නිට්ටඹුව නගරයට පැමිණ වමට හැරී කොළඹ නුවර ප්‍රධාන මාගර්යේ කොළඹ දෙසට ගමන් කර මල්වත්ත හන්දියෙන් දකුණට හැරී විද්‍යාලෝක මාවතේ පිහිටි ශ්‍රී බෝධි විහාරස්ථානය වෙත පැමිණීමට නියමිතව ඇත.

පෙරහැර නැරඹීම සඳහා විශාල ජනකායක් පැමිණෙතැයි අපේක්ෂා කරන අතර නුවර - කොළඹ ප්‍රධාන මාගර්යේ අධික රථවාහන තදබදයක් ඇති වීමට ඉඩ ඇති බැවින් එම කාලය තුළ නිට්ටඹුව නගරයේ සිට මල්වත්ත හන්දිය දක්වා වූ කොටස කොළඹ දෙසට හා නුවර දෙසට ගමන් කරන රථවාහන සඳහා මාගර්යේ එක් මංතීරුවක් දෙකට බෙදා වාහන ගමන් කරවීමට සැලසුම් කර ඇත.

### විකල්ප මාගර්

- කොළඹ සිට නුවර දෙසට හා කුරුණෑගල දෙසට ගමන් කරන සැහැල්ලු වාහන කලගේඩිහේන හන්දියෙන් වමට හැරී වේයන්ගොඩ නගරයට පැමිණ නිට්ටඹුව දෙසට ගමන් කර වමට හැරී කොට්ටල මාගර්යේ මල්ලැහැව හන්දිය දක්වා ගමන් කර පස්යාල මීරිගම මාගර්යට පිවිස, කුරුණෑගල දෙසට ගමන් කරන වාහන වමට හැරී මීරිගම දෙසටත් නුවර දෙසට ගමන් කරන වාහන දකුණට හැරී පස්යාල දෙසටත් ගමන් කළ හැක.

- මීරිගම දෙස සිට පැමිණ කොළඹ දෙසට ගමන් කරන වාහන පස්යාල දෙසට පැමිණ මල්ලැහැව හන්දියෙන් දකුණට හැරී වේයන්ගොඩ හරහා කලගේඩිහේන දෙසටත්, කිරිඳවැල දෙස සිට කොළඹ දෙසට ගමන් කරන වාහන අත්තනගල්ල දෙස සිට නිට්ටඹුව අලෝක සංඥා අසලින් වේයන්ගොඩ දක්වා ගමන් කර කලගේඩිහේන දෙසට ගමන් කල හැක.

- කටුනායක දෙස සිට කිරිඳවැල දෙසට ගමන් කරන සැහැල්ලු වාහන වේයන්ගොඩ නගරය පසුකර වමට ඇති කොට්ටල මාගර්ය ඔස්සේ ගමන් කර මල්ලැහැව හන්දියෙන් දකුණට හැරි පස්යාල හන්දිය හරහා අත්තනගල්ල දෙසට ගමන් කල හැක.

- කිරිඳවැල දෙස සිට නුවර දෙසට ගමන් කරන වාහන අත්තනගල්ල හන්දියෙන් පස්යාල දෙසට ගමන් කල හැක.

ඉහත නිවේදනය සම්බන්ධව මහජනතාවගේ සහ රියදුරන්ගේ දැනගැනීම සඳහා ඔබ මාධ්‍ය ආයතනය මඟින් ප්‍රචාරයක් ලබා දීමට කටයුතු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**